ද මැසිනෝද් විදුහල - කඳාන

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2019 ජූලි

24-07-2019
2019 A/L

අවසාන වාර පරීක්ෂණය

නර්තනය (දේශීය)

කාලය පැය 02 යි.

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 1 සිට 25 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා අදාල අංකය වරහන තුළ ලියන්න.

1. "පහතරට ශාන්ති කර්ම සාහිත්‍ය" යන කෘතිය රචනා කර ඇත්තේ
   - I මුදියන්සේ දිසානායක මහතා
   - II තිස්ස කාරියවසම් මහතා
   - III ජයසේන කෝට්ටේගොඩ මහතා
   - IV එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

2. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි ලෙස සැලකෙන්නේ
   - I මල පේ කිරීම සහ මිල්ල කැපීම
   - II මලපේ කිරීම සහ බිසෝ කප සිටුවීම
   - III තොට පේ කිරීම සහ බිසෝ කප සිටුවීම
   - IV හගලේ යැදීම සහ අයිලේ යැදීම

3. හත් අඩියේ කවි ගායනා දැකිය හැක්කේ
   - I කොහොඹා කංකාරියේ දීය
   - II දෙවොල් මඩුවේදීය
   - III සූනියම් යාගයේ දීය
   - IV පහන් මඩුවේදීය
   - V රට යැකුමේදීය

4. දිවිදොස් පුවද පිළිබඳ සඳහන් සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් වන්නේ,
   - I දීප වංශය සහ රාජාවලිය
   - II කුවේණි අස්න හා සිහබා අස්නය
   - III කුවේණි අස්නය හා දඹදෙණි අස්නය
   - IV දීපවංශය සහ මහා වංශය
   - V මහාවංශය හා ථූපවංශය

5. දෙවොල් නැටීම හා අඹවිදම නම් නර්තනාංග දැකිය හැකි වන්නේ,
   - I සබරගමු පහන් මඩුවේය
   - II පහතරට දෙවොල් මඩුවේය
   - III උඩරට කොහොඹා කංකාරියේය
   - IV ගම් මඩුවලදීය
   - V බලි ශාන්තිකර්ම වලදීය

6. සූනියම හා රටයකුම යන ශාන්තිකර්ම වලට අයත් නාට්‍යම නර්තන අංගයක් ලෙස සැලකෙන්නේ ,
   - I වඩිග පටුන හා ඇත්බන්ධනය

Learning Resource Center
R
De Mazenod College
Kandana

II	වඩිග පටුන හා ගබඩාකොල්ලය
III	මරා ඉපැද්දීම හා දෙවොල් ගොඩබැසීමය
IV	වඩිග පටුන හා දරු තැලවිල්ලය
V	නාතුමුරය හා මරා ඉපැද්දීමය

7. බලි ශාන්තිකර්මයට අයත් සුවිශේෂී වූ ගායනා ලෙස සැලකෙන්නේ,
I	ඇඩුම් කවි, ග්‍රහ පන්ති, මල් යහන් කවි
II	උඩැක්කි කවි, සිරස පාද කවි, ග්‍රහ පන්ති
III	මල් යහන් කවි, උඩැක්කි, පන්තේරු කවි
IV	ඇඹුම් කවි, ග්‍රහ පන්ති, හීං හතතේ කවි
V	ග්‍රහ පන්ති, උඩැක්කි කවි, හීං හතතේ කවි

8. කෝලම් නාට්‍යයේ අතිමානුෂ චරිත ලෙස සැලකෙන්නේ,
I	පූර්ණක හා ලියන අප්පු
II	පූර්ණක හා මුදලාලි
III	ගුරුළු රාක්‍ෂ හා නාග රාක්‍ෂ
IV	නාග රාක්‍ෂ හා ජසයා

9. අක්කා ඉතින් නාඩන්නේ මෙහි
I	ලඝු 01 ගුරු සදැස්මත් 14 කි.
II	ලඝු 01 ගුරු 06 සදැස්මත් 13 කි.
III	ලඝු 02 ගුරු 06 සදැස්මත් 13 කි.
IV	ලඝු 02 ගුරු 05 සදැස්මත් 11 කි.
V	ලඝු 03 ගුරු 05 සදැස්මත් 10 කි.

10. ජිං කඩතක ජිං කුකුනත මෙය
I	මාත්‍රා 4 + 3 දෙතිතටය.
II	මාත්‍රා 3 + 3 තනිතිතටය.
III	මාත්‍රා 2 + 3 දෙතිතටය.
IV	මාත්‍රා 4 + 4 දෙතිතටය.
V	මාත්‍රා 2 + 4 දෙතිතටය.

11. කන්දේ බණ්ඩාර, ඉගුරුගල් බණ්ඩාර හා කළු තුමා පුද ලබන්නේ,
I	රටයැකුමේදී ය.	II	කොහොඹාකංකාරියේ දිය.
III	දෙවොල් මඩුවේදී ය.	IV	පහන් මඩුවේදී ය.
V	සුනියම් යාගයේදී ය.

12. "පිදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රුදි " මෙම පද්‍ය ඇතුලත් වන්නේ කුමන සන්දේශ කාව්‍යයට ද?
I	මයුර සංදේශය	II	සැවුල් සංදේශය
III	තිසර සන්දේශය	IV	සැළලිහිනි සන්දේශය
V	හංස සන්දේශය

13. සංබපාල හා අසුපාල කතා පුවත්වලට පසුබිම වී ඇත්තේ,
I	කොහොඹා කංකාරිය	II	සුනියම් ශාන්තියයි
III	සන්නි යැකුම් යාගයයි	IV	පහන් මඩුවයි
V	දහ අට සන්නියයි

14. නර්තනයේ පුද්ගල හා පොදු අවකාශ භාවිත මූලධර්ම මත යොදාගන්නා තල හා දිසා සංඛ්‍යාව වන්නේ.

I තල 3 දිසා 6 යි.
II තල 3 දිසා 10 යි.
III තල 3 දිසා 6 යි.
IV තල 4 දිසා 7 යි.
V තල 4 දිසා 8 යි.

15. දේශීය නර්තනයට සෘජුවම සම්බන්ධවන අවනද්ධ භාණ්ඩ ලෙස සැලකෙන්නේ.

I ගැටබෙරය, තම්මැට්ටම, දවුල හා දඩුබෙරයයි.
II ගැටබෙරය දෙවොල් බෙරය, දවුල හා දඩුබෙරයයි.
III ගැටබෙරය , පහතරට බෙරය, දවුල හා උඩැක්කිය.
IV ගැටබෙරය , උඩරට බෙරය , දවුල හා තම්මැට්ටමයි.
V උඩරටබෙරය , පහතරට බෙරය , තම්මැට්ටම හා දඩු බෙරයයි.

16. මනිපුරි නර්තන සම්ප්‍රදායේ පැවැත්ම සඳහා පුරෝගාමී වූයේ

I රවිද්‍රනාත් තාගෝර් තුමාය
II බිර්ජුමහාරාජ් තුමාය
III නවාබ් වජිඩ් අලීෂා
IV බාල සරස්වතී
V මහාචාර්ය වික්‍රමසිංහ

17. දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් 500 ක් පමණ ගී ගයා නර්තනය කළ බව සඳහන් වන්නේ,

I ඉබන් බතුතාගේ වාර්ථාවේය
II රොබට් නොක්ස්ගේ වාර්ථාවෙනි
III පංහියන්ගේ වාර්ථාවෙනි
IV ස්පිල් බර්ජන්ගේ වාර්ථාවෙනි
V ජෝර්ජ් කිට්ගේ වාර්ථාවෙනි

18. පක්වාජ් සහ තබ්ලාව වාදනය කරනු ලබන්නේ කුමන භාරතීය නර්තන සම්ප්‍රදායටද?

I දක්ෂිණ භාරතීය භරත නර්තනයටය.
II දක්ෂිණ භාරතීය කථකලි නර්තනයටය.
III දක්ෂිණ භාරතීය කුච්චිපුඩි නර්තන.
IV උත්තර භාරතීය කථක් නර්තනයටය.
V උත්තර භාරතීය මනිපුරි නර්තනයටය.

19. ද්‍රවිඩ - සිංහල සංස්කෘතිය හා බැඳි සමාන ගැමි නැටුම් මොනවා ද?

I කෝලාට්ටම - ලී, සුලකු - කළල
II කෝලට්ටම් - ලී , සුලකු - කුලු
III කෝලට්ටම් - කුලු , සුලකු, - ලී
IV වෙම්බු - කලි , අරුවිවෙට්ටු - ලී
V වෙම්බු - කල , අරුවිවෙට්ටු - කුළු

20. ශිවරංග සහ තිත්තබත යන මුද්‍රා නාටක නිර්මාණය කළ ශිල්පින් වන්නේ,

I චිත්‍රසේන ඩයස් සහ ප්‍රේම කුමාර එපිටවෙලය.
II චිත්‍රසේන ඩයස් සහ ශේෂා පලිහක්කාරය.
III චිත්‍රසේන ඩයස් සහ වසන්ත කුමාර.
IV වසන්ත කුමාර සහ ප්‍රේමකුමාර එපිටවෙලය.
V ප්‍රේමකුමාර එපිටවෙල සහ වසන්ත කුමාර.

21. මහා රාස්, වසන්තරාස් , කුංජ රාස් , නෘත්‍ය රාස් යන නර්තන අන්තර්ගතව ඇත්තේ කුමන නර්තන සම්ප්‍රදායේ ද?

I කථකලි II මනිපුරි III භරත

IV කථක V බටහිර බැලේ

22. ශාන්ති දේව ඝෝෂ් විසින් ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන ලද මුද්‍රා නාට්‍ය ලෙස දැක්වෙන්නේ,

I ජන්දන්තදායම් හා කිඳුරගත ය

II ජන්දන්තදායම් හා වේදනා ය

III සීතාහරණ හා වේදනාය

IV සීතාහරණය හා මනෝහාර බන්ධනම් ය

V මනෝහාර බන්ධනම් හා විධුර

23. දකුණු භාරතීය භරත නාට්‍යම් නර්තනයට යොදා ගන්නා සුවිශේෂ තත් භාණ්ඩය වන්නේ,

I සිතාරයයි II වීණාවයි III එස්රාජයයි

IV තාම්පුරාවයි V ජේනාවයි

24. ලොව ප්‍රකට හංසවිල බැලේ නාට්‍යය සඳහා දායක වූ ප්‍රවීණ සංගීතඥයා හා හංස ධේනුවගේ චරිතයට පණ දුන් ප්‍රවීන නිළිය වන්නේ

I චෙකොස්කිවි සහ ඉසඩෝරා ඩන්කන් ය.

II ජීන් ජෝර්ජ්නෝවේර් සහ ඉසඩෝරා ඩන්කන් ය

III චෙකොස්කිවි සහ ගලීනා උලනෝවා ය

IV ගලීනා උලනෝවා සහ මාරියස් පෙටිපා ය

V වස්ලව් නිජින්ස්කි සහ තාමරා තච්චනෝවා ය

25. ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම් කලාව අයත් යුගය කුමක් ද?

I පොලොන්නරු II ගම්පොල III දඹදෙණිය

IV අනුරාධපුර V කුරුණෑගල

නර්තනය 24.07.2019 12 ශ්‍රේණිය III වාරය 2019 A/L

අංක 26 සිට 35 දක්වා ප්‍රශ්නවලට අදාල පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

26. ඩෙප්පු යනු ________________ නර්තන සම්ප්‍රදාය හා බැඳි අංග සෑවනා විධියකි.

27. වාහල නැටීම ________________ දෙවියන් වෙනුවෙන් කරනු ලබයි.

28. වලියක් මංගල්‍ය පවත්වනු ලබන්නේ ________________ දේවාල භූමියේ ඉදිරිපිටය.

29. මීනාක්ෂි සුන්දරම්පිල්ලේ වඩාත් ප්‍රසිද්ධත්වයට පත් වූයේ ________________ නර්තන සම්ප්‍රධායටය.

30. නර්තනයේදී ශරීරයේ උපාංග කොටස් හැඟීම් දනවන අයුරින් මැනවින් පිළිබිඹු වන්නේ ________________ අභිනයෙනි.

31. තිතිත දනමන සවන පිනවන මෙය ________________ අයත් කොටසකි.

32. කෝලම් නාටකයේ දවුලක් කරලා යන චරිතය ________________ වේ.

33. සන්නියකුම් යාගයේදී මෝල්ගස් යොදා සාදාගනු ලබන විදිය ________________ නමින් හඳුන්වයි.

34. පහතරට ශාන්ති කර්මවලදී අඳුරා හඳුන්වන්නේ ________________ නමින්.

35. බලි ශාන්තිකර්මවලදී බලි අඳුරාගේ අතෙහි ඇති රංග භාණ්ඩය වන ________________ ඝන වාද්‍ය භාණ්ඩයකි.

36. භරත නාටනම් ශිල්පිනිය සිරසට පළඳිනු ලබන ආභරන වේ.

I ________________ II ________________

Learning Resource Centre
R
De Mazenod College
Kandana

37. පටාචාරි හා බැරිසිල් මුද්‍රා නාට්‍යයේ අධ්‍යක්‍ෂවරුන් වන්නේ

I ________________ II ________________

38. ගුරුගේ මාලාව හා මල් මඩුපුරය යන නර්තනාංග අයත් නර්තන සම්ප්‍රධායන් මොනවා ද?

ගුරුගේ මාලාව ________________

මල් මඩුපුරය ________________

39. හත් අඩියේ හා හිං හතරේ කවි අයත් ශාන්තිකර්ම මොනවා ද?

I ________________

II ________________

40. බැලේ නර්තන ශිල්පින් භාවිත කරන රංග වස්ත්‍රාභරණ දෙක හඳුන්වන්නේ කුමන නම් වලින් ද?

I කෙටි සාය ________________

II සෘවහත් ________________

41. කථකලි හා භරත නර්තන සම්ප්‍රධායේ වේෂ නිරූපනය නම් කරන්න.

I ________________ II ________________

42. පහතරට නර්තනයේ ප්‍රවීණ නර්තන ශිල්පීන් K.S. ප්‍රනාන්දු මහතා විසින් වේදිකාවට සකස් කරන ලද නර්තන අංග දෙකක් නම් කරන්න.

I ________________________________

II ________________________________

43. ප්‍රේම කුමාර එපිටවෙල විසින් නිර්මාණය කරන ලද වත්කම කුමක් ද? එය නම්කරන ලද්දේ කීවෙනි වත්තම ලෙස ද?

I ____________________ II ____________________

44. මාර්තා ග්‍රැහැම් හා ජීන් ජෝර්ජ් නෝවේ අයත් රටවල් දෙක ලියන්න.

I ____________________ II ____________________

45. කථකලි සහ භරත නර්තන සම්ප්‍රදායන්වල ගුරුවරුන් හඳුන්වන විශේෂ නාම දෙක.

I කථකලි ____________________ II භරත ____________________

46. 1943 හා 1978 දේශීය නර්තන කලාවේ සිදු වූ සුවිශේෂී සිද්ධි මොනවා ද?

1943 -

1978 -

47. මුල් වෙස්බැඳි කාන්තාව වීමේ ගෞරවය හිමි තැනැත්තිය හා ඇයගේ බෙරවාදක ශිල්පියාගේ නම් කරන්න.

I නර්තන ශිල්පිනිය ____________________

II බෙරවාදක ශිල්පියා ____________________

48. පහත දැක්වෙන නර්තනාංග උයත් වන්නේ කුමන සම්ප්‍රදායන් වලට ද?

I ශුද්ධ මාත්‍රය ____________________

II මුල් මාත්‍රය ____________________

49. නාට්‍ය ශාස්ත්‍රය සහ අභිනය දර්පනය යන ග්‍රන්තදෙක රචනා කළ භාරතීය පඬිවරුන් දෙදෙනා කවු ද?

I ____________________ II ____________________

50. සාලිය කුමරු දඩයමේ යන විට එහිදී ප්‍රථම වරට අශෝකමාලා මුන ගැසේ. ඇයගේ රූප ස්වභාවයට වශී වූ සාලිය ඇය කෙරෙහි ප්‍රේමාන්විත සිතක් පලකර ගනී. නෙතට නෙත ගැටුනු අශෝකමාලා ඇගේ සිතෙහිද සාලිය පිලිබඳ ආදරයක් සිතෙහි ඇති වේ.

I භාවය ____________________

II රසය ____________________

24.07.2019 13 ශ්‍රේණිය III වාරය 2019 A/L නර්තනය

❖ කොටසේ ප්‍රශ්න අනිවාර්ය වේ.

II , III යන කොටස්වල ඇති ප්‍රශ්නවල ප්‍රශ්න ඇතුළත් වනසේ ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න.

1) I පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙරපද තෝරාගෙන ප්‍රස්ථාර කරන්න.

❖ "රුදඟ ජින්තක තකට කුංදත්"
❖ ගත්තම් දොම් ගත ගුගුද ගුදං

II ඉපල් පිටින් ගහන අවුව පිටට ඉතිරි වන්නේ මෙම කවි පදය ප්‍රස්ථාර කරන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

2) දේශීය නර්තනය පිළිබඳ කරුණු සෙවීමේදී මූලාශ අපට වැදගත් වේ.

I මහාවංශය හා ථූපවංශ යන වංශකතා වලින් හෙළිවන නර්තනයේ තොරතුරු ගෙන හැර දක්වන්න.

II ඒ ඒ යුගවල තූර්‍ය භාණ්ඩ පැවති බවට මූලාශ්‍ර සාදක දක්වන්න ඒ පිළිබඳ කරුණු විමසන්න.

III 1930 පසු නර්තනයේ වෙනස්වීම අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපෑ ආකාරය විස්තර කරන්න.

## II කොටස

3) ශාන්ති කර්ම වල දී සාම්ප්‍රදායික නර්තන වල ආවේණික ලක්ෂණ, විවිධතා හා සමානතා මෙන්ම සමාජ සම්බන්ධතා ද මැනවින් විද්‍යාමාන වේ.

I පහතරට නර්තන සම්ප්‍රධායේ රටයැකුම හා දොවොල් මඩු ශාන්තිකර්මයන් හි නාට්‍යමය පෙලපාලිවල චරිත නිරූපනය අවස්ථා දෙකක් ඇසුරෙන් ඉහත පාඨය සනාථ කරන්න.

II සමාජ සම්බන්ධතා සාරධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන ආකාරය කොහොඹා කංකාරිය ශාන්ති කර්මය ඇසුරෙන් විග්‍රහ කරන්න.

III සන්නි යකුමේ පුරාවෘත්ත මගින් හෙළිවන බෞද්ධාගමික පසුබිම හා විශ්වාස විමසන්න.

4) I සොකරි නාටකයේ එන චරිත දෙකක් හඳුන්වා දී එක් චරිතයකට භාවිත බෙර පද හා කවිය බැගින් ලියන්න.

II ගැමි නැටුමේ ඇති සුවිශේෂි ලක්ෂණ මෙන්ම ගැමි ගායනා තුළද ඔවුන්ගේ ජීවන රටාව හෙළි වේ. ඒ පිළිබඳව අදහස් දක්වන්න.

III කෝලම් නාටකයේ එන කාරිය කරවනසේ කාරය භාරය පිළිබඳ විමසුමට ලක් කරන්න.

5) "පහතරට ශාන්ති කර්ම සතර අභිනයෙන්ම පොහොසත්ය"

එම කියමන පහත මාතෘකා යටතේ කරුණු දක්වන්න.

I රටයකුමේ සාත්වික අභිනය

II සන්නි යකුමේ ආහාර්ය අභිනය

III ආංගික අභිනය හා වාචික අභිනය දෙවොල් මඩුවේ දැකිය හැකි ආකාරය.

## III කොටස

6)


A



B



C



I නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ පිළිබඳව දක්වන්න.

II C නර්තනයේ ප්‍රභවය පිළිබඳව ඇති ආගමික පසුබිම විස්තර කරන්න.

III B නර්තනයේ ඉතිහාසය පිළිබඳව දක්වන්න.

7) I ශ්‍රී ලාංකේය උඩරට නර්තන ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙක් නම් කර එක් අයෙකු කල සේවාව පිළිබඳ විමසුමක් කරන්න.

II චිත්‍රසේනයන් අතින් නිර්මාණය වූ කරදිය මුද්‍රා නාට්‍යය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

III නර්තන කලාව ලබා ඇති නූතන ප්‍රවනතා දක්වන්න.

8) I 21 වන සියවසේ දේශීය නර්තනය මුහුණ පෑ අභියෝග මොනවා ද?

II රූපවාහිනිය මගින් ඉදිරිපත් කරන නර්තන වැඩසටහන් රස සඳහා වර්ධනයට කෙසේ බලපායි ද?

III ප්‍රාසාංගික නර්තනයේ රංගවස්ත්‍රාභරණ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

18 JUL 2019



# ද මැසිනොද් විදුහල කඳාන
# De Mazenod College - Kandana
# සිංහල භාෂාව II

2019 ජූලි | පැය 3

13 ශ්‍රේණිය

I කොටසේ 1 ප්‍රශ්නයද, II කොටසේ 2 ප්‍රශ්නයද ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

- පහත සඳහන් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර ඉදිරියෙන් ලියන්න.

01) සඤ්ඤක අක්ෂර සේ සැලකෙන්නේ කවරක්ද ?
1. ය,ර,ල,ව
2. ක,ච,ට,ත,ප
3. ශ,ෂ,ස,ළ,ෆ
4. ඞ,ඤ,ණ,න,ම
5. ඟ,ඦ,ඬ,ඳ,ඹ,

02) අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
1. අනුරාධපුරය, අලව්ව, අතුරුගිරිය, අඹේපුස්ස
2. කතරගම, කළුතර, කඩුවෙල, කදුරුවෙල
3. මාතර, මාතලේ,මාලිගාතැන්න,මාවතගම
4. වවුනියාව, වඳුරඹ,වලපනේ, වඩමරච්චි
5. තණමල්විල, තවලම, තලවතුගොඩ, තලාව

( .......... )

03) සෑම පදයකම පාපිල්ල යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. නිසල, විසිතුරු, තිතර, මතක
2. දුදන, විරිත, වෙළඳ, බැදුම
3. කොටුව, තුහුරු, කුර,සෘතුව
4. නාදය,රුපු,දුලබ,කපටි
5. මාරුතය,සුවඳ, කුළුබඩු, උඳුවප්

( .......... )

04) උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
1. අනුවර්තනය, විවර්ණ, සංවාදය, ප්‍රතිපක්ෂ
2. අව්‍යාජ, නිර්දේශ, අස්වාභාවික, උපගුරු
3. අවගුණ, පරදේශ, අනුමාන, නොමනා
4. නිරුත්තර, පරෝපදේශය, උපකල්පනය, පරිහාසය
5. සංවර්ධනය, අභේද්‍ය, පරිවර්තනය, අසංවරය

( .......... )

05) පහත සඳහන් වාක්‍යවල අංකිත පදවලට නොගැලපෙන ව්‍යාකරණ අංගය දක්වෙන වරණය තෝරන්න.
1. මාගේ <u>කාමරයෙහි</u> ඇඳන් දෙකක් ඇත. ( ආධාර කාරකය )
2. නංගී <u>කෙක්කෙන්</u> මල් කඩයි ( කරණ කාරකය )
3. අපි ගංවතුරෙන් <u>අනාථවූවන්ට</u> පිහිට වෙමු ( සම්ප්‍රදාන කාරකය )
4. ලේනා <u>වහලයෙන්</u> බිමට වැටුණි ( ආධාර කාරකය )
5. ආදි <u>ශිෂ්‍යයන්</u> විසින් විදුහල්පතිතුමා පිළගැනිණින ( කර්තෘ කාරකය )

( .......... )

06) ගයනුකිත්ත, රකාරාංශය, රේඵය, හා යංශය සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. පෞද්ගලික, දූජිත, ක්‍රමික, විද්‍යාව
2. සෞන්දර්ය, ප්‍රබුද්ධ, කණී, ඓක්‍යය
3. ප්‍රවර්ග, උගණිරෝම, උපෞෂථ, ධාන්‍යය
4. ඖරසපුත්‍ර, මෞර්ය, අතයී,අලෞකික, ප්‍රකට
5. විදෙ‍්‍යා්දය, ඖදායී, අලෞකික, ප්‍රකට

( .......... )

07) ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
1. සියලු සිංහලයන් නිවැරදි සිංහලය උගනිත්වා
2. පයින් යන්නෝ පදික වේදිකාවෙන් යා යුතුය
3. විශාඛා සිටු දේවිය ශ්‍රද්ධාවන්ත උපාසිකාවක මෙන්ම යහපත් පතිනියක්ද වූවාය
4. සියලු ඥාති මිත්‍රාදීන් මේ සංවේගදායක නිවේදනය පිළිගනිත්වා
5. මා උසස් පෙළ විභාගය සමත් වෙතියි මගේ මව සිතයි

( .......... )

08) තද්ධිත පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

1. බුද්ධිමත්, අයෝමය, නෛතික, කළටී
2. සිටාණෝ, දියණියෝ, ගැමි, රූමත්
3. භෞතික, සෞන්දර්යය, ඒකීය, ඇහැටු
4. කැබිලිති, පාරම්පරික, දූහැමි, කාලීන
5. දානමය, දිරිමත්, ජනතා, ආරටු ( .......... )

09) ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයන් සහිත පද පේළිය තෝරන්න.

1. මෙන්, හෝ, කෙරෙන්, වනාහි
2. දිගටි, දියඹ, ගුණවත්, පහටි
3. ලියමන්, නැටිලි, ඉඳුම්, ගෙරවිලි
4. කැබිලිති, පාරම්පරික, දූහැමි, කාලීන
5. දානමය, දිරිමත්, ජනතා,අරටු ( .......... )

10) එකිනෙකාට අනුරූප වන සේ වචන යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. කළුවර මන්දිරය, ව්‍යාකරණ ලකුණු, සූර්ය මඬල, තාරකා පෙළ
2. ප්‍රධාන පුවත්, කර්තෘ මඬුල්ල, අහස් ගැබ, ප්‍රීති වාක්‍යය
3. ප්‍රවෘත්ති පත්‍ර, ශ්‍රව්‍ය කාව්‍ය, ප්‍රකාශන අංශය, ශුභ මුහුර්තය
4. ධාරනිපාත වැස්ස, ප්‍රාචීන බස ඉගනුම, නභෝගැබ, පුලස්තිපුර රජදහන
5. දළඳා මන්දිරය, සාරගර්භ දෙසුම. නෑ මිත්‍ර සමූහය, අභිනව මැදුර ( .......... )

11) එකමවරගයකට අයත් සන්ධි පද අන්තර්ගත වර්ණය තෝරන්න.

1. අතිනත, දකුණත, දිගත, සුරත
2. කොස්සැට, උරුමක්කාර, අල්ලස්, පොල්ලත්ත
3. ශාස්ත්‍රාලය, මුනීන්ද්‍ර, ක්‍රිස්තුත්පත්තිය, යථාර්ථ
4. ජාත්‍යාලය, විද්‍යාලය, හස්ත්‍යාලංකාර, කාව්‍යාවලිය
5. පුනරුත්, මෙයාකාර, කටුවල, දැවුරුදු ( .......... )

12) <u>සුරන්</u> සහ <u>සහසැස්</u> <u>නො</u>කර සිටියේ අහස් කුස හිස්... යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පස අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලටද ?

1. නිපාත, සමාස, විභක්ති
2. සමාස, නිපාත, විභක්ති
3. විභක්ති, සමාස, නිපාත
4. විභක්ති, නිපාත, සමාස
5. නිපාත, විභක්ති, සමාස ( .......... )

13) එකිනෙකට අනුරූප වන සේ වචන යෙදී ඇති වරණය තෝරන්න.

1. චන්ද්‍ර බිම්බය, මහ මර්ගය, ගගන ගැබ, විබත් ප්‍රත්‍යය
2. සඳබිඹුව, මහමඟ, ගුවන් ගර්භව. විභක්ති පස
3. නීල උපුල්. මහා මාර්ගය, චන්ද්‍ර බිම්බය, ගුවන් ගැබ
4. නීල උත්පල, මහ මඟ, චන්ද්‍ර බිම්බය, ගුවන් ගැබ
5. නිල් උපුල්, මහ මග, සඳ බිඹුව, ගුවන් ගැබ ( .......... )

1.14 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

(1) අවලස්සන; අවපීඩන, අවකම්පන, අවමාන
(2) දුර්ජන, දුර්මත, දුර්නීති, දුර්විපාක
(3) අබිසෙස්, අබිමන්, අබිමුව, අබිදහම්
(4) විශිෂ්ට, විදේශ, විමධ්‍යගත, විමාන
(5) පිරිසුදු, පිරිපුන්, පිරිනිවන, පිරිසිඳ (..............)

1.15 <u>ගනඳුර</u> වසන විට ආ<u>ලෝකයෙහි</u> නෙත
<u>සඳරුස්</u> ගලන විට <u>කුරපී</u> සෙවණ මත
මෙම පද්‍ය පාදවල **කද කළු අකුරින් මුද්‍රිත පදවල** ව්‍යාකරණ අංග පිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?

(1) සන්ධි, විභක්ති, ක්‍රියා, සමාස
(2) සමාස, විභක්ති, සන්ධි, ක්‍රියා
(3) සන්ධි, විභක්ති, සමාස, ක්‍රියා
(4) සමාස, ක්‍රියා, සන්ධි, විභක්ති
(5) සන්ධි, සමාස, විභක්ති, ක්‍රියා (..............)

1.16 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක් ද?

(1) පුනරුක්ති, පුනරාගමනය, පුනරීක්ෂණය, පුනරුදය
(2) අදනා, රඳනා, බඳනා, පවනා
(3) කියත, දමත, බඳින, අදිත
(4) නුවනත්, සවනත්, කොපුලත්, ගහණත්
(5) අතුර, මතුර, වපුර, විසුර (..............)

1.17 සමාසයක් නො වන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අනාදර, අව්‍යක්ත, අනවශ්‍ය, අශික්ෂිත
(2) මුහුදුදිය, ගම්වැසි, සරාසඳ, තැඹිලිතෙල්
(3) දසබල, විදුරත්, තිනෙත්, සහස්පත
(4) දුහුල්සළු, රතුපුල්, නිල්අහස, පිරිපත
(5) දෙව්බඹ, වතුපිටි, ගුරුසිසු, අඹදඹ (..............)

1.18 එක ම වර්ගයකට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) කම්මුල, පෙස්සම, ගෙත්නම්, අල්ලස්
(2) දැස, විරෝදාර, එකිනෙක, සූර්යෝදය
(3) නළඟන, කරිඳු, නුවනග, දිනිඳු
(4) මංපෙත්, ගම්පොළ, මිහින්තල, කඹුරු
(5) අත්‍යලංකාර, අන්වර්ථ, අභ්‍යුදය, නීත්‍යනුකූල (..............)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(1) මම දක්ෂ නාට්‍ය නිෂ්පාදකයකු වෙමි.
(2) තාපසවරුන් වනයේ පලාපල අනුභව කරත්ලු
(3) ගුරුතුමා තම ශිෂ්‍යයන් යහමග යවති.
(4) තම ඥාති මිත්‍රාදීන් සමග මනාලිය විවාහ මංගලෝත්සවයට පැමිණියා ය.
(5) සෝමා දක්ෂ ගායිකාවක් ද නිළියක ද වන්නීය. (..............)

1.20 වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.

(1) මුළු පවුල ම ලබන සතියේ විදේශගත වන බව ඇය පැවසුවා ය.
(2) තාක්ෂණය මානවසංහතියේ ප්‍රගමනය සඳහා යොදාගැනීම වැදගත් ය.
(3) තුන්වන ලෝකයේ රට වල දරිද්‍රතාව තුරන් කරදීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රයත්නයයි.
(4) සිංහල කෙටිකතාවේ වර්ධනය උදෙසා බටහිර කෙටිකතාවේ ආභාසය ලැබුණුබව විචාරකයින් ගේ මතයයි.
(5) ලාංකික දූ දරුවන් ගේ වග කීම වන්නේ නිදහස් අධ්‍යාපනයේ නිසිපල ලබාගැනීමයි.

(..............)

(ලකුණු 20 යි).

[4වන පිටුව බලන්න.

Learning Resource Centre R 18 JUL 2019 De Mazenod College Kand



## II කොටස

* මෙම කොටසේ 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාව ජලයෙන් පෝෂිත රටකි. ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම හේතුවෙන් නිරිත දිග සහ ඊසාන දිග මෝසම් සුළඟ අපට ප්‍රධාන වශයෙන් වැසි ගෙන දෙන අතර කුඩා දිවයිනක් වීම නිසා සංවහන වැසි ද සුලභ ය. රට මැද පිහිටි මධ්‍යම කඳුකරය නිසා පතිත වර්ෂාව රට පුරා විහිදී ගංගා 103ක් ඔස්සේ මුහුදට ගලා යයි. බටහිර, නිරිත සහ දකුණු දිග ප්‍රදේශය ප්‍රබල නිරිත දිග මෝසම් සුළං මුහුණතේ පිහිටීමෙන් ජලය සුලභ ව ලැබේ. එහෙත් ඊසාන දිග මෝසම් සුළඟ විශාල ගොඩබිම් කලාපයක් හරහා හමා එන බැවින් ජලවාෂ්ප අඩු නිසා එමගින් ජනිත වර්ෂාව අඩු ය. එබැවින් ඊසාන දිග මෝසම් මුහුණතේ පවතින කලාපය රටේ වියළි කලාපය බවට පත් ව ඇත. එනමුදු අනුරපුර පොළොන්නරු රාජධානි පැවැති කාලයේ දී කෘෂිකර්මාන්තය අග්‍රස්ථානයක වැජඹුණු අතර අපරට පෙරදිග ධාන්‍යාගාරය නමින් ද හැඳින්විය. එදවස අහසින් පතිත ජලය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩක් නො වීම එයට හේතුව විය. වැව් බැඳි රජරට සහ රුහුණේ පැවැති වාපි සංස්කෘතිය ශ්‍රී ලංකාවට ආවේණික ජල කළමනාකරණයයි. එය ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාව රැගෙන ගියේ ය. තෙත් කලාපයට ලැබුණු අධික වර්ෂාව තම ජීවනෝපාය සඳහා නොගැළපුණු බැවින් වියළි කලාපයේ වසන්නට අපේ ආදිතමයෝ උනන්දු වූහ. එහෙත් ඒ සඳහා ද ප්‍රමාණවත් වර්ෂාවක් ලැබුණේ නැත. එබැවින් ලද වර්ෂාවේ ජලය එක්රැස් කර ප්‍රයෝජනයට ගැනීමට ආදී වැසියා උත්සුක වූයේ ය. වාපි සංස්කෘතිය එමගින් අප ලත් දායාදයකි.

(i) ශ්‍රී ලංකාවට වැසි සුලබ වීමට බලපාන හේතු ලෙස ඉදිරිපත් කළ හැකි කරුණු මොනවා ද?
(ii) ආදිතමයන් තෙත් කලාපය බැහැර කොට වියළි කලාපයේ වාසය කරන්නට රුචියක් දැක්වූයේ ඇයි?
(iii) වාපි සංස්කෘතිය අප රටට දායාද වූයේ කෙසේ ද?
(iv) ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් උදාකර ගත්තේ කෙසේ ද?
(v) ඊසාන දිග මෝසම් මුහුණතේ පවතින ප්‍රදේශය රටේ වියළි කලාපය බවට පත් වූයේ ඇයි?

(ලකුණු 10 යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

පර්යේෂකයන්ගේ නිගමනවලට හා විද්‍යමාන භාෂා වාර්තා සාක්ෂිවලට අනුව සිංහල භාෂාව පැරණි ඉන්දු ආර්ය භාෂා සම්ප්‍රදායෙන් තත්භව වූවක් ලෙස පිළිගැනේ. සිංහලය හා ඉන්දු ආර්ය භාෂා අතර පවත්නා ශබ්ද නීතිගත සාම්‍යතාව මෙයට ප්‍රධාන සාධකය ලෙස ඔවුහු සඳහන් කරති. එහෙත් සිංහල භාෂාව විකාශනයෙහි එක් එක් අවස්ථාවල දී විවිධ භාෂා සම්ප්‍රදායවල ආභාසය ලැබ් තිබෙන බව දැක ගත හැකි ය. එසේ බලපෑ ප්‍රධාන භාෂාවක් ලෙස බොහෝ දෙනාගේ අවධානයට ලක් ව ඇත්තේ දෙමළ භාෂාව යි. දෙමළ භාෂාව අංශ කිහිපයක් ඔස්සේ සිංහලයට බලපා තිබීම මෙයට හේතුව යි. භූ විස්තෘතිය වශයෙන් සිංහල භාෂාවට වඩාත් ආසන්න ව දක්නට ලැබෙන්නේ ද්‍රවිඩ භාෂා ගණයට අයත් භාෂා ය. එසේ ම වර්තමානයේ පවතින ව්‍යවහාරවලට අමතර ව ක්‍රි. පූ. 3 වන සියවසේ සිට අද තෙක් ම අඛණ්ඩ ව පැවත එන සිංහල ලේඛන සම්ප්‍රදායට දෙමළ භාෂාවේ ආභාසය ලැබ තිබීම ද එක් සාධකයකි. මේ ඔස්සේ ද්‍රවිඩ සෘණ වචන රාශියක් සිංහලයට එකතු වී ඇත. මීට අමතර ව බොහෝ දෙනෙකු පෙන්වා දෙන ආකාරයට සිංහලයේ වාක්කෝෂය මතු නො ව වියරණය ද සැකසී ඇත්තේ දෙමළ ව්‍යාකරණය පදනම් කොටගෙන ය. ව්‍යාකරණ නීති රීති මගින් ද විවිධ පද යෙදුම් එකතු වෙමින් සිංහලයේ වාක්කෝෂය පෝෂණය වීමට දෙමළ භාෂාව බෙහෙවින් ම බලපා ඇති බව උගත් භාෂාඥයෝ පෙන්වා දෙති. ක්‍රි.පූ. යුගවල පටන් ම දෙමළ භාෂාව සිංහලය කෙරෙහි බලපාමින් පැවති බව පෙන්වා දෙන වාග්වේදීන් සඳහන් කරන්නේ එය දෙයාකාරයකින් සිදු වී ඇති බව යි. එනම්, ද්විභාෂක ලේඛකයන් මගින් හා පොදු ජනතාව හා දෙමළ භාෂකයන් අතර වූ සම්පර්කය මගින් ය.

(ලකුණු 15 යි)

[5වන පිටුව බලන්න.

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

1. ජනසමාජයක ප්‍රගමනය සඳහා උසස් දේශපාලන නායකත්වයක අවශ්‍යතාව
2. මානව සමාජයෙහි යහපත සඳහා සාහිත්‍යය යොදාගැනීම
3. බෝ නොවන රෝගවල සමාජ විපාක
4. අන්තවාදය වෙනුවට ආගමික සංහිඳියාව මතුකිරීමේ වැදගත්කම
5. රටක සංවර්ධනයෙහිලා කෘෂි ආර්ථිකය වැදගත්වන ආකාරය (ලකුණු 25 යි)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.
   (i) චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට රසිකයෝ පැමිණෙති'යි මම සිතීමි.
   (ii) ආපදාවෙන් විපතට පත් වූවෝ බේරා ගැනීමට කිසිවකු ඉදිරිපත් වී නැත.
   (iii) සාමය උදෙසා ලෝක බලවත්තු එකාවන්ව නැගී සිටිත්.
   (iv) අමාත්‍ය මණ්ඩලයේ කෙනෙක් නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළහ.
   (v) නීතිඥයන් නිවැරදිකරුවෝ මුදා හැර වැරදිකරුවන් නීතියේ රැහැනට කොටු කරගත යුතු ය. (ලකුණු 05 යි)

(ආ) පහත සඳහන් වාක්‍යය කර්මකාරකයට හරවන්න.
   (i) උසස් අධ්‍යාපන ආයතන නව වසර සඳහා සිසුන් බඳවා ගනියි.
   (ii) දෙමවුපියෝ ගුරුවරුන් සඳහා උපහාර උළෙලක් සංවිධානය කරවන්නෝ ය.
   (iii) දේශප්‍රේමීහු ස්වාර්ථය පතා රටෙහි නීතීන් උල්ලංඝනය නො කරත්.
   (iv) රියැදුරෙක් මහ මග වැටී සිටි ගැබිනියක රෝහල් ගත කළේ ය.
   (v) රටෙහි ජනතාව රකින්නෝ රණවිරුවෝ ය. (ලකුණු 05 යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
   (i) පුවත්පත් (කලාවේදීහු/කලාවේදීන්) පැමිණිය හොත් අපි සාකච්ඡාව ආරම්භ කරමු.
   (ii) විදග්ධ කවියෝ ආධුනික (කිවිඳියන්/කිවිඳියෝ) කැටුව කවි සම්මේලනයට සහභාගි වූහ.
   (iii) මග දෙපස වූ නන් පැහැගත් (ප්‍රදීපයෝ/ප්‍රදීපයන්) නගරය අලංකාර කළහ.
   (iv) සභාතොමෝ නව ව්‍යවස්ථාව ඒකච්ඡන්දයෙන් සම්මත (කළාය/කළහ)
   (v) මෙම වසරේ ජනප්‍රිය ගායකයා (කවරෙක්/කවරෙකු) ද? (ලකුණු 05 යි)

**5. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. එහි අනුංගය ලියා දක්වන්න.**

1. මා පාඩම් කළහොත් දෙමාපියෝ සිත් සතුටු කරගනිමින් තින්දට යති.
   **කළහොත් - ක්‍රියා , දෙමාපියෝ - විභක්ති , කරගනිමින් - ක්‍රියා**
2. දූරබලනය අප්‍රානගත වීම නිසා ප්‍රබල ප්‍රහාරයකට මුහුණ දීමට නිලධාරියාට සිදු විය.
   **දූරබලනය - කෘදන්ත , නිසා- නිපාත , ප්‍රබල - සමාස**
3. ඔබිනොබ රැස් වූ ජනතාව අසැබි වදනින් කෑගසද්දී අනුශූරතාව දිනූ කණ්ඩායම කලබල විය.
   **ඔබිනොබ - සන්ධි , කෑගසද්දී - ක්‍රියා , අනුශූරතාව - සමාස**
4. කැහැටු බල්ලා ගැමි මිනිසුන්ගේ පාද සපාකෑම නිසා ගමපුරා ජලභීතිකා බිය පැතිරිණි.
   **කැහැටු- තද්ධිත , මිනිසුන්ගේ - විභක්ති , ජලභීතිකා - සමාස**
5. ගෝනියක දමා තිබූ සහල් දුටුවහොත් විදුහල්පතිතුමා මට දඬුවම් කරනු ඇත.
   **ගෝනියක- විභක්ති , දුටුවහොත්- ක්‍රියා , විදුහල්පතිතුමා - සන්ධි**



[6වන පිටුව බලන්න.

6. පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(නිවැරදි, හෙළ, සුරැකීම, දේශීය, සංරක්ෂණය, නිරවද්‍ය)

(අ) (i) ............................ වෙදකම වනාහි පුරාතනයේ පටන් පැවත එන්නකි.

(ii) රටක අනාගත සංවර්ධනය උදෙසා නායකයන් සතු .................... දැක්ම ඉවහල් වෙයි.

(iii) ...................... තාක්ෂණය ප්‍රබල ව ඉස්මතු වූ අංශයක් වනුයේ වාරි කර්මාන්තය යි.

(iv) පුරාවස්තු ..................... සංචාරක ආකර්ෂණයට හේතුවකි.

(v) භාෂාවක් භාවිතයේ දී ...................... ව්‍යවහාරය අතිශයින් වැදගත් ය.

(vi) දරුවන් ...................... සමාජ සේවා නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණයට ලක් විය යුතු ය.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) අධ්‍යයන + අංශය (ii) ක්‍රිස්තු + උත්පත්තිය

(iii) එකින් + එක (iv) ජන්ම + උත්සවය

(v) බුද්ධි + ඉන්ද්‍රිය (vi) පුර + අඟන

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **දරුවනි,** මා එන තුරු නිහඬ ව සිටින්නැයි **ගුරුතුමා** කීවේ ය.

(ii) "එන්න **දියේ** බැස මා හා - දෙන්න **ඔබේ** අත මාලා"

(iii) පරිසරය අලංකාර කරන **සතුන්** පිළිබඳ ව අපි **දරුවන්ට** කියා දුන්නෙමු.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) විදේශ සංචාරකයා ලංකාවට පැමිණියේ ය සීගිරියට ගියේ ය. එය ක්‍රි ව පස් වන සියවසේ දී නිර්මාණය කළ බව අසා ඔහු පුදුම විය.

(ii) දරුවා අඬමින් ඉකි ගසමින් මවගේ උකුළෙහි දිගා වූයේ ය. ඈ දොයි දොයි දොයි යනුවෙන් ඔහු නැළවූවා ය.

(iii) ශිෂ්‍යයා ශිෂ්‍යාව 'මඟුල් කෑම' ග්‍රන්ථයේ 24 26 පිටුවලින් ඡේද උපුටා දක්වයි.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මං අද විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් පත්‍රය යවනවා"යි නාලිකා පැවසුවා ය.

(ii) "ඩෙංගු රෝගය පැතිරීම වළක්වා ගැනීමට ඔබගේ නිවස සහ අවට පරිසරය පිරිසිදු ව තබා ගන්නැ"යි මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුම් දුන්නේ ය.

(iii) "අපි අපේ දරුවන්ට උගන්නන්නේ හරියට දුක් මහන්සි වෙලා"යි දෙමවුපියෝ ගුරුවරුන්ට පැවසූහ.

(ලකුණු 01 x 3 = 03 යි.)

07) ඉ) ලෝක ධර්මී නාට්‍ය යංවාද නාට්‍ය ලෙස ද ස්වාභාවික නාට්‍ය ලෙස ද හැඳින්වේ. **භරතමුනි** විසින් දක්වනු ලැබ ඇති **ආකාරයට** මෙහි නළුවන් අභිනය පාන්නේ **ස්වාභාවික** ලෙස ය. වඩාත් පැහැදිලි ව කිවහොත් නළුවාගේ කතා බහ ආංගික චලනය මුහුණෙන් පිළිබිඹු කරන හැඟීම් නාට්‍යයේ පසුතලය ආදිය සාමාන්‍ය ලෝක ස්වභාවයට සමාන වන්නේ නම් එවැනි නාට්‍යයක් හඳුන්වන්නට ලෝක ධර්මී යන්න වඩා නිවැරදි වේ. මෙවැනි නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂකයා කෙබඳු **තත්ත්වයකට** ලක්වන්නේ ද යන්න ද විමසිය යුතු ය. ලෝක ධර්මී නාට්‍ය නරඹමින් ප්‍රේක්ෂකයා **උපකල්පනය** කරන්නේ තමා ඉදිරියේ සිදුවන්නේ සත්‍ය සිදුවීමක් බවයි. නළු නිළි ඇඳුම් පැළඳුම්, වෙස් ගැන්වීම, කතා බහ, පසුතලය ආදිය සාමාන්‍ය ලෝකයට - එදිනෙදා ජීවිතයට සමීප ලෙස ගොඩ නගා තිබීම නිසා ප්‍රේක්ෂකයාට තමා නරඹන්නේ සත්‍යයක් - යථාර්ථයක් බව හැඟී යයි. ප්‍රේක්ෂකයා **සත්‍යයක්** යැයි සිතමින් නාට්‍යය නැරඹීමේ ස්වභාවය මහාචාර්ය සරච්චන්ද්‍ර හඳුන්වන්නේ තත්ත්වානුරූපී මායාව ලෙසයි.

1. ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.
2. පිළිබිඹු, යථාර්ථයක්, එදිනෙදා යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.
3. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
    1. නාසික්‍ය අක්ෂරයක් සහ මූර්ධජ අක්ෂරයක් (එකතින් පසුව අනික) යෙදී ඇති වචනයක්
    2. දන්තජ අක්ෂරයක් සහ ඕෂ්ඨජ අක්ෂරයක් යෙදුණු වචනයක්
    3. රේඵ අක්ෂරයක් සහ ඕෂ්ඨජ අක්ෂරයක් පිළිවෙළින් යෙදුණු වචනයක්
4. පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

   යථාර්ථයක් , ආංගික , තත්ත්වානුරූපී
5. පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.

   මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා , අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(ලකුණු 03 X 5 = 15 යි.)

08) පහත සඳහන් මාතෘකා වලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න

1. ස්වරසන්ධිය
2. මිශ්‍ර ක්‍රියා
3. උපසර්ග පද
4. විශේෂණසමාසය
5. කර්ම කාරක වාක්‍ය සහ කර්තෘ කාරක වාක්‍ය